www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සමාජවාදී සමානතා පක්ෂයේ ඓතිහාසික සහ ජාත්‍යන්තර පදනම් -- 2 වන කොටස

**The Historical and International Foundations of the Socialist Equality Party—Part 2**

*එක්සත් ජනදයේ සමාජවාදී සමානතා පක්ෂයේ ඓතිහාසික සහ ජාත්‍යන්තර පදනම් ලියවිල්ල කොටස් වසයෙන් පල කිරීම අපි ආරම්භ කර ඇත්තෙමු. පසුගිය අගෝස්තු 3-9 දිනවල පැවති සසප ආරම්භක සම්මේලනයේ දී මෙම ලියවිල්ල පුලුල් ලෙස සාකච්ඡා කරනු ලැබ ඒකමතිකව සම්මත කර ගන්නා ලදි. සම්මේලනයේ දී සම්මත කෙරුනු සමාජවාදී සමානතා පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශය ද මීට පෙර ලෝක සමාජවාදී වෙබ් අඩවියේ පල විය.*

## අධිරාජ්‍යවාදී යුද්ධය සහ දෙවන ජාත්‍යන්තරය බිඳ වැටීම

20. ලෝක ධනවාදය තුල වර්ධනය වෙමින් පැවැති ආතතීහු පලමුවන ලෝක යුද්ධය ලෙස පුපුරා ගිය අතර, සකල භයංකරත්වයන් මගින් එය ප්‍රකාශ කර සිටියේ "ධනේශ්වර ක්‍රමයේ මර ලතෝනිය" ද ලෝක සමාජවාදී විප්ලවය ද එලඹ ඇති බවය. 1880 ගනන් තරම් ඈත දී, එංගල්ස් ධනේශ්වර යුදවාදයේ ද, යුද්ධයේ ද අන්තරාය හා පල විපාක ගැන අනතුරු අඟවා තිබුනි. 1914ට පෙර සම්මේලන ගනනාවකදී දෙවන ජාත්‍යන්තරය යුද්ධය පුපුරා යාමට එරෙහිව නැගී සිටින ලෙස කම්කරු පන්තිය කැඳවමින්, යුද්ධය යම්කිසි විධියකින් පුපුරා ගියහොත් "මහා ජනකාය පුබුදුවා ධනවාදයේ අවසානය ඉක්මන් කරන" ලෙස කම්කරු පන්තිය අනවමින් ප්‍රකාශන ගනනාවක් නිකුත් කර තිබුනි. කෙසේ වෙතත් ධනේශ්වර යුරෝපය තුල දිගු කලක් ගැබ්ව පැවති සට්ටන අවුලුවාලූ ගිනි පුපුර වූයේ, 1914 ජුනි මස 28 දින ඕස්ට්‍රියානු ඔටුන්න හිමි කුමාරයා වූ ආර්ච් ඩියුක් ෆ්‍රාන්ස් ෆර්ඩිනන්ඩ් ඝාතනය කිරීමයි. මෙහි දී රෑ එලිවීමටත් මත්තෙන් එලිදරව් වූයේ සමාජවාදී ව්‍යාපාරය තුල අවස්ථාවාදය කොතරම්දුරට වැඩී පැවැත්තේ ද යන්නයි. 1914 අගෝස්තු 4 දා, එස්පීඩීයේ නියෝජිතයෝ යුද්ධයට මුදල් සම්පාදනය කිරීමට පක්ෂව තම ඡන්දය පාවිච්චි කලෝ ය. ජාත්‍යන්තරයේ ප්‍රමුඛ පක්ෂ සියල්ලම පාහේ තම තමන්ගේ ධනේශ්වර ආන්ඩුවල යුද පිලිවෙත් පිටුපස පෙලගැසුනාහ.

21. දෙවන ජාත්‍යන්තරයේ පාවා දීමට විරුද්ධවූ බොල්ශෙවික් පක්ෂය, ලෙනින්ගේ නායකත්වය යටතේ යුද්ධයට එරෙහිව ඉදිරියට පැමිනියේ ය. යුද්ධය පුපුරා අවුරුද්දක් ගතවීමට පෙරාතුව ලෙනින් සට්ටනය, " ධනේශ්වර, අධිරාජ්‍යවාදී සහ රාජවංශික යුද්ධයක් ය"යි නිර්වචනය කරමින් සම්පාදනය කල යෝජනාව මෙසේ ප්‍රකාශ කලේ යඃ

1889- 1914 අතර, දෙවන ජාත්‍යන්තරයේ වඩාත්ම ශක්තිමත් හා අධිකාරවත් වූ පක්ෂය දැන් යුද නයට පක්ෂව ඡන්දය දී ප්‍රෂියානු යුන්කරයන් (වංශාධිපතීන්) ගේ ද ධනේශ්වරයේ ද වචනම ප්‍රතිරාවය කරමින් සිටියි. ඒ ජර්මානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයයි. එහි නායකයන් ගේ හැසිරීම වනාහී තනිකරම සමාජවාදය පාවාදීමකි. ජර්මානු සමාජ ප්‍රජාතන්ත්‍ර පක්ෂයේ නායකයන්ගේ හැසිරීම කුමන තත්වයක් යටතේ වුව, ජර්මන් පක්ෂය පරම වශයෙන් ම දුබල වී යයි ද ජාතියේ ධනේශ්වර බහුතරය ඉදිරියේ දන නමන්නට එයට සිදුවී යයි ද අප උපකල්පනය කලත්, අනුමත කල නොහැකි ය. ඇත්ත වශයෙන් ම පක්ෂය ජාතික-ලිබරල් පිලිවෙතක් අනුගමනය කර තිබේ. [1]

22. යෝජනාව, ප්‍රන්ස හා බෙල්ජියම් පක්ෂවල ක්‍රියාවන් ද "එසේම තුච්ඡය"යි හෙලාදැක්කේ ය.[2] 1914 අගෝස්තුවේ ඛේදජනක සිද්ධීන්, අවශ්‍ය දේශපාලන හා ඓතිහාසික සන්දර්භයක තබමින් එය මෙසේ ප්‍රකාශ කලේ යඃ

දෙවන ජාත්‍යන්තරයේ (1889-1914) නායකයන් බොහෝ දෙනෙකු විසින් සමාජවාදය පාවාදීම, එම ජාත්‍යන්තරයේ දෘෂ්ටිමය සහ දේශපාලන බංකොලොත් බව ඉස්මතු කරයි. මෙම පාවාදීමට ප්‍රධාන වශයෙන් ම හේතු වී ඇත්තේ සියලු රටවල විප්ලවවාදී කම්කරු පන්තියේ ශ්‍රේෂ්ඨතර නියෝජිතයන් විසින් බොහෝ කලකට පෙර ධනේශ්වර ස්වභාවයක් දරන්නේ යයි ද, අන්තරාදායක යයි ද, හඳුන්වා තිබෙන (සමාජ ප්‍රජාතන්ත්‍රවාදය පුරා) පැතිර පවත්නා සුලුධනේශ්වර අවස්ථාවාදය යි. සුලුධනේශ්වර අවස්ථාවාදීහු සමාජවාදී විප්ලවය ප්‍රතික්ෂේප කොට ඒ වෙනුවට ධනේශ්වර අවස්ථාවාදය යොදා ගනිමින් ද, කිසියම් අවස්ථාවකදී සිවිල් යුද්ධයක් බවට අනිවාර්යයෙන්ම පරිවර්තනය වීමට නියමිත පන්ති අරගලය ප්‍රතික්ෂේප කරමින් ද, ඒ වෙනුවට පන්ති සහයෝගිතාව දේශනා කරමින් ද, දේශප්‍රේමයේ වේෂයෙන් ධනේශ්වර

ජාතෝත්තමවාදය දේශනා කරමින් ද, කොමියුනිස්ට් ප්‍රකාශනය විසින් බොහෝ කලකට පෙර ඉදිරිපත් කරන ලද සමාජවාදයේ අති මූලික සත්‍යය වූ කම්කරුවන්ට මාතෘභූමියක් නැතැයි යන්න නොතකා හරිමින් ද, ප්‍රතික්ෂේප කරමින් ද, යුදවාදයට එරෙහිව අරගලයේ දී, සෑම රටකම කම්කරුවන් සෑම රටකම ධනේශ්වරයට විරුද්ධව ජාත්‍යන්තර විප්ලවවාදී යුද්ධයකට සූදානම් විය යුතු ය යන සත්‍යය ඉවත දමා, ඒ වෙනුවට හැඟීම්බර පිලිස්තීනු දෘෂ්ටි ආස්ථානයකට සීමාවෙමින් ද, පාර්ලිමේන්තුවාදය හා ධනේශ්වර නීත්‍යානුකූල භාවය ප්‍රයෝජනයට ගැනීමේ අවශ්‍යතාවය සුරුවමක් බවට හරවා ගනිමින් ද, අර්බුද සමයයන්හි දී නීති විරෝධී සංවිධාන රූප අවශ්‍ය බව අමතක කරමින් ද, දෙවන ජාත්‍යන්තරය ව්‍යසනයකට ඇද හෙලීමට අවස්ථාවාදීහු දීර්ඝ කාලයක් තිස්සේ කල්යල් බලා සූදානම් වෙමින් සිටියෝ ය.[3]

23. දෙවන ජාත්‍යන්තරයේ යටත්වීම වනාහී එම සංවිධානය විප්ලවවාදී අරගලයේ උපකරනයක් වශයෙන් දේශපාලනික මරනයට පත්වීම බව ලෙනින් අවධාරනය කලේ ය. එහෙයින් නව, තුන්වන ජාත්‍යන්තරයක් නිර්මානය කිරීම සඳහා ඉදිරියට යා යුතු විය. මෙම නව ජාත්‍යන්තරය 1914 දී අගෝස්තුවේ දී තමන් ලෝක කම්කරු පන්ති ව්‍යාපාරය තුල අධිරාජ්‍යවාදයේ උපකරනයක් ලෙස එලිදරව් කරගෙන තිබුනු අවස්ථාවාදයට එරෙහි අශමනීය අරගලයක් මත පදනම් කරගත යුතුව තිබුනි. දෙවන ජාත්‍යන්තරයේ පාවා දීම පුද්ගලික වැරදි සහ දුබලකම්වල ප්‍රතිඵලයක් වූ පරිද්දෙන් එම සිද්ධිය අල්පකරනය ට තුඩු දුන් කුමන අර්ථකථනයක් වුව ලෙනින් විසින් ප්‍රතික්ෂේප කරන ලදී. ඔහු මෙසේ ලිවී ය. "කුමන ආකාරයකින් බැලුවත් ප්‍රවනතාවන් අතර අරගලය ද, කම්කරු පන්ති ව්‍යාපාරයේ නව කාලපරිච්ඡේදයක් පිලිබඳ ප්‍රශ්නය වෙනුවට පුද්ගලයන් ගේ භූමිකාව පිලිබඳ ප්‍රශ්නය ආදේශ කිරීම ද, විකාර සහගතය." [4] ලෙනින් පූර්වාපේක්ෂා කල පරිදි මාක්ස්වාදය සහ අවස්ථාවාදය අතර භේදය කම්කරු ව්‍යාපාරයේ ජාතික ජාතෝත්තමවාදී ප්‍රවනතාවන් ද ජාත්‍යන්තර ප්‍රවනතාවන් ද අතර සෑම රටක් තුල ම ප්‍රකාශිත වූ නව අතිමූලික භේදයක් පහල කලේ ය. නව කොමියුනිස්ට් පක්ෂ පැන නැංගේ මෙම භේදයෙනි.

24. දෙවන ලෝක යුද්ධයේ මුල්, ධනවාදයේ සංවර්ධනය තුලට ගැඹුරුව කාවැදී තිබුනි. එන්න එන්නම ගෝලීයකරනය වන ආර්ථිකය ද ධනේශ්වර-රාජ්‍ය පද්ධතිය ද අතර ප්‍රතිසතිතාව මෙහිදී විශේෂයෙන් සඳහන් කල යුතු ය. 1915 දී ට්‍රොට්ස්කි මෙසේ ලිවී ය: "වත්මන් යුද්ධය වනාහී එහි පතුලෙන්ම, නිෂ්පාදන බලවේගයන් ජාතියේ හා රාජ්‍යයේ දේශපාලන රූපාකෘතියට එරෙහිව ගසන කැරැල්ලකි. එයින් අර්ථනය වන්නේ ජාතික රාජ්‍ය ස්වාධීන ආර්ථික ඒකකයක් ලෙස බිඳ වැටීම ය. 1914 යුද්ධය වනාහී මෙතෙක් ඉතිහාසයේ දක්නට ලැබුන, ආර්ථික පද්ධතියක් එයට ම ආවේනික වූ ප්‍රතිසතිතාවන් විසින් බිඳදමනු ලැබීම පිලිබඳ දැවැන්තතම සිද්ධියයි." [5] මෙහි අර්ථය වන්නේ ජාතික ආර්ථිකයන් යෝධ වර්ධනයක් අත්පත් කර ගත්තා වූ කාල පරිච්ඡේදයක් තුල වර්ධනය වී තිබුනු, සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂ තමන්ගේ ක්‍රියාරටාවන් දශක ගනනාවක් තිස්සේ හැඩ ගස්වා ගෙන තිබුනු සුපුරුදු තත්වයන් හදිසියේ බිඳ වැටීම මගින්, අරටුවටම සොලවා ලනු ලැබීම ය. විප්ලවවාදී පර්යාලෝකය නිල න්‍යායික හා වාචික ආකාරයකට ආරක්ෂා කිරීම ඉතා සීරුවෙන්, ප්‍රධාන කොටම ප්‍රතිසංස්කරනවාදී ස්වභාවයක් ඉසුලූ භාවිතයක් සමග, තුලනය කරගනු ලැබිනි. එහෙත් තත්වයන්ගේ සිදුවූ පරිවර්තනය දේශපාලන හා න්‍යායික 'ඩබල් බුක්කීපිං' (දෙබිඩි ගනන් බැලීම්) තව දුරටත් කරගෙන යා නොහැකි තත්වයක් උද්ගත කලේ ය. "ඒවා අත්විඳි ඓතිහාසික බිඳවැටීමේ දී ජාතික රාජ්‍යයෝ තමන් සමග ජාතික සමාජවාදී පක්ෂයන් ද කඩා බිඳ දමා ඇත. ජාතික රාජ්‍යයන්, නිෂ්පාදන බලවේගවල වර්ධනයට බාධකයක් බවට පත්ව ඇත්තේ යම් සේ ද, පැරනි සමාජවාදී පක්ෂ ද කම්කරු පන්තියේ විප්ලවවාදී ගමනට බාධාවක් බවට පත්ව තිබේ." [6]

25. දෙවන ජාත්‍යන්තරය තුල අවස්ථාවාදයේ උල්පත් තව දුරටත් නිරීක්ෂනය කල ලෙනින්, අධිරාජ්‍යවාදයේ පැන නැඟීමත් සමග ලෝක ධනේශ්වර ව්‍යුහයෙහි හටගත් සාරභූත ආර්ථික සහ සමාජ-දේශපාලන වෙනස්කම් විශ්ලේෂනය කලේ ය. 1914 අගෝස්තුවේ දී ජර්මානු සමාජ ප්‍රජාතන්ත්‍රයේ අවස්ථාවාදයට යටත්වූ න්‍යායාචාර්ය කාර්ල් කවුට්ස්කිගේ සූත්‍රයන් විවේචනය කල ලෙනින් අධිරාජ්‍යවාදය වනාහී හුදෙක් "තෝරාගනු ලැබූ" පිලිවෙතක් ය යන, කවුට්ස්කිගේ අභ්‍යර්ථනය ප්‍රතික්ෂේප කලේ ය. ඒ වෙනුවට ලෙනින් මෙසේ පැහැදිලි කලේය:

...අධිරාජ්‍යවාදය වනාහී ධනේශ්වර ක්‍රමයේ එක් නිශ්චිත ඓතිහාසික අවධියකි. එහි නිශ්චිත ස්වභාවය තුන් ආකාරවේ: 1. ඒකාධිකාරී ධනවාදය 2. පරපුටු හෝ දිරාපත්වන ධනවාදය 3. යල්පැන ගිය ධනවාදය. නිදහස් තරගය ඒකාධිකාරය විසින් විස්ථාපනය කිරීම අධිරාජ්‍යවාදයේ අති මූලික ලක්ෂයයි, සාරයයි. [7]

26. ලෝක ආර්ථිකය හා ප්‍රමුඛ ධනේශ්වර බලවතුන් අතර සම්බන්ධතා පිලිබඳ සාමකාමී, අවිහිංසාවාදී හා අධිරාජ්‍යවාදී නොවන වැනි මන්ත්‍ර වලින් මෝහනයට පත්කරන න්‍යායක් වූ කවුට්ස්කිගේ "අති අධිරාජ්‍යවාදය" ද, ලෙනින් බැහැර කලේය.

ලෙනින් ලියූ පරිදි, කරුනේ හරය නම් කවුට්ස්කි අධිරාජ්‍යවාදයේ දේශපාලනය, එහි අර්ථ ශාස්ත්‍රයෙන් වෙන් කොට, (රටවල් හා ප්‍රදේශ) ඈඳා ගැනීම මූල්‍ය ප්‍රාග්ධනය විසින් "වැඩි කැමැත්තක් දක්වන" පිලිවෙතක් හැටියට ඉදිරිපත් කරමින් එම පිලිවෙතට විකල්පයක් ලෙස මූල්‍ය ප්‍රාග්ධනයේ පදනමේම තවත් පිලිවෙතක්

ද තිබිය හැකි යයි කතා කිරීම ය. මේ අනුව ගතහොත්, ආර්ථික ක්ෂේත්‍රයේ ඒකාධිකාරයන් සමග එකට දේශපාලන ක්ෂේත්‍රයේ ඒකාධිකාරී නුවූ, ප්‍රචන්ඩ නොවූ, ප්‍රදේශ යටත් කර නොගන්නාවූ විධික්‍රමයන් පැවතිය හැකි ය. ඉන් ගලා එන්නේ මූල්‍ය ප්‍රාග්ධනයේ මෙම යුගය තුලදී ම සම්පූර්න කරන ලද, අද ද විශාලතම ධනපති රටවල් අතර සුවිශේෂ ආකාර ප්‍රතිමල්ලතාවක් ජනිත කරන්නා වූ, ලෝකය භෞමික වශයෙන් පංගු කර ගැනීම අධිරාජ්‍යවාදී නොවන පිලිවෙතක් සමග සමහන් කල හැකි බවකි. මෙහි ප්‍රතිඵලය වන්නේ ධනවාදයේ අලුත්ම අවධිය තුල පවත්නා ප්‍රගාඪතම ප්‍රතිසතිතාවන් අකාමකා දැමීම ය; ඒවායේ ගැඹුර එලිදරව් නොකර හැරීම ය; මෙහි ප්‍රතිඵලය වන්නේ මාක්ස්වාදය වෙනුවට ධනේශ්වර ප්‍රතිසංස්කරනවාදය (වැලඳගැනීම යි). [8]

## රුසියන් විප්ලවය නොනවතින විප්ලව න්‍යාය සනාථ කරයි

27. අධිරාජ්‍යවාදී යුද්ධය යුරෝපය තුල විප්ලවවාදී පිපිරීම්වලට දොර හරින බව 1914 සහ 1917 අතරතුර සමයේ දී ලෙනින් හා ට්‍රොට්ස්කි කල් තියාම දැක ගත්හ. මෙම ඉදිරි දර්ශනය පෙබරවාරි විප්ලවය පුපුරා යාමත් සමග සනාථ විය. පෙබරවාරි විප්ලවය පැනනැංගේ යුද්ධය ද, එය විසින් රුසියානු සමාජයේ අර්බුදය උග්‍ර කිරීම ද තුලින් ය. 1917 පෙබරවාරි විප්ලවය සාර් රජු පෙරලා දැමීමෙන් පසුව පැන නැගුනු, තාවකාලික ආන්ඩුවට සහාය දුන් මෙන්ෂෙවික්වරු, කම්කරු පන්ති විප්ලවයකට විරුද්ධ වූහ. තාවකාලික ආන්ඩුව ධනේශ්වර දේපල සබඳතාවන් ආරක්ෂා කරමින්, ගොවි ජනතාවට ඉඩම් පවරා දීමට විරුද්ධවී, යුද්ධය දිගටම පවත්වාගෙන යාමට ක්‍රියා කලේය. 1917 අප්‍රේල් මාසයේ දී රුසියාවට ආපසු පැමිනි ලෙනින්, දිගු කලක් බොල්ශෙවික් ක්‍රියාමාර්ගය තුල පැවති ප්‍රජාතන්ත්‍රවාදී ඒකාධිපතිත්වය පිටු දැක කම්කරු පන්තිය තාවකාලික ආන්ඩුවට විරුද්ධව නැගී සිට සෝවියට් සභා මගින් බලය අල්ලා ගතයුතුව ඇතැයි කියා සිටියේ ය. මෙම ආස්ථානය සෑම සාරභූත අංශයකින් ම ට්‍රොට්ස්කිගේ නොනවතින විප්ලව න්‍යාය සනාථ කලේ ය. විප්ලවවාදී වර්ධනය ගත් සැබෑ ගමන් මාවත අත්‍යසාමාන්‍ය ලෙස පූර්වාපේක්ෂාකල ට්‍රොට්ස්කිගේ න්‍යාය, 1917 අප්‍රේල් මාසයේ දී ලෙනින් විසින් බොල්ශෙවික් පක්ෂය තීරනාත්මක ලෙස නව දිශාගත කිරීමකට භාජන කිරීමේදී ඊට, න්‍යායික හා දේශපාලන අත්තිවාරම් දැමී ය. ලෙනින් විසින් ට්‍රොට්ස්කිගේ ඉදිරි දර්ශනය යොදාගනු ලැබීම, ස්ටැලින් ද ඇතුලු බොහෝ බොල්ශෙවිකයන්ගේ කටුක විරෝධයට පාත්‍ර විය. 1917 අප්‍රේල් මස ලෙනින් රුසියාවට ලඟා වීමට පෙර, බොල්ශෙවික් පක්ෂයේ ප්‍රව්ඩා පත්‍රයේ කතුවරයා ලෙස ස්ටැලින් ගත් ආස්ථානය වූයේ තාවකාලික ආන්ඩුවට විවේචනාත්මක සහාය දිය යුතුය යන්නයි. ස්ටැලින් යුද්ධය පවත්වාගෙන යාමට ද සහාය දුනි.

28. ධනේශ්වර තාවකාලික ආන්ඩුව පෙරලා දැමීම සූදානම් කල පෙරාතු මාස තුල ලෙනින්, රාජ්‍යය පිලිබඳ විෂයය ගැන මාක්ස් සහ එංගල්ස් ගේ ලේඛන පිලිබඳ පෘථුල අධ්‍යයනයක යෙදුනි. අවස්ථාවාදීන් රජය වනාහී පන්ති වලට උඩින් පිහිටි, පන්තීන් අතර බේදයන් සමහන් කරන බේරුම් කාර ආයතනයකැයි පෙන්නුම් කිරීමට යත්න දරමින් සිටි තත්වයක් තුල මෙම අධ්‍යයනයෙන් ඊට පිලිතුරු සැපයුනි. රාජ්‍යය වනාහී ධනේශ්වරය විසින් තම පන්ති පාලනය ආරක්ෂා කර ගැනීමට ද, කම්කරු පන්තිය පීඩාවට ලක් කර සූරා කෑමට ද, යොදනු ලබන මර්දනකාරී අවයවයක් යයි එංගල්ස් විසින් කරන ලද නිර්වචනය ලෙනින් අවධාරනය කලේය. 20 වන සියවස තුල දී මෙම නිර්වචනයේ අදාල බව බිංදු මාත්‍රයක් හෝ අඩු වී නැතැයි ලෙනින් තර්ක කලේ ය. එයට ප්‍රතිකූලවඃ

අධිරාජ්‍යවාදය, එනම් බැංකු ප්‍රාග්ධනයේ යුගය, දැවැන්ත ධනේශ්වර ඒකාධිකාරයන්ගේ ඒකාධිකාරී ධනවාදය රාජ්‍ය-ඒකාධිකාරී ධනවාදය කරා වර්ධනය වන යුගය තුල, "රාජ්‍ය යන්ත්‍රය" අත්‍යසාමාන්‍ය ලෙස ශක්තිමත් කිරීමක් ද, එහි මිලිටරි හා නිලධාරි තන්ත්‍රය යන දෙක ම, රාජාන්ඩුවල මෙන් ම වඩා නිදහස් සමූහාන්ඩුවාදී රටවල ද, කම්කරු පන්තියට එරෙහිව මර්දනකාරී පියවරයන් ගැනීමේදී, පෙරනුවූ විරූ මට්ටමකට වර්ධනය කොට ඇති අයුරු ද පෙන්නුම් කරයි. [9]

29. 1917 ඔක්තෝබරයේ දී, පීට්‍රොග්‍රෑඩ් සෝවියට් සභාවේ බහුතරය දිනා ගත් බෝල්ශෙවිකයෝ, ට්‍රොට්ස්කිගේ නායකත්වය යටතේ සන්නද්ධ නැගිටීමක් සංවිධානය කොට, තාවකාලික ආන්ඩුව පෙරලා දමා, සෝවියට් සභාවලට බලය පවරා ගත්හ. 1917 ඔක්තෝබර් විප්ලවය වනාහී බොල්ශෙවික්වරුන් විසින් මහජන සහයෝගයෙන් තොරව සිදුකරන ලද කුමන්ත්‍රනකාරී "බල කොල්ලයක්" ය යන විවේචන, බරපතල ඓතිහාසික පර්යේෂනයන් මගින් ඛන්ඩනය කරනු ලැබ ඇත. [10] ඇත්ත වශයෙන් ධනේශ්වර පාලනතන්ත්‍රය පෙරලා දැමීම සඳහා ඉහවහා යන සහයක් රුසියාවේ අගනුවර වූ පීට්‍රොග්‍රෑඩ් නගරයේ කම්කරු පන්තියෙන් ලැබුනි. එහෙත් බොල්ශෙවික් නායකත්වය තුල නම් ඊට සැලකියයුතු විරුද්ධත්වයක් පැවැතුනි. ලෙනින් ගේ සමීපතම සගයන් අතර වූ ලෙව් කමනෙව් හා ග්‍රිගෝරි සිනොවියෙව්, සන්නද්ධ නැගිටීමක් ව්‍යසනයකින් කෙලවර වනු ඇතැයි ඒත්තු ගෙන සිටියේය. ඒ වන විටත් තාවකාලික ආන්ඩුවේ නායක කෙරෙන්ස්කිගේ අනසකට නතුව තිබුනු සැලකියයුතු හමුදා බලය ද, විශේෂයෙන්ම අගනුවර වටා යොදා තිබුනු කාලතුවක්කු බල ඇනි ද, ඔවුහු අපේක්ෂා කලහ. එහෙත් ඉක්බිති සිද්ධීන් පෙන්නුම් කලේ, සන්නද්ධ නැගිටීම කෙරේ බොල්ශෙවික් පක්ෂයම තුල සිටි විරුද්ධවාදීන්ගේ ගනන් බැලීම් කිසිසේත් ම තථ්‍ය නුවූ බවය. තාවකාලික ආන්ඩුව

පෙරලා දැමීම සැලකියයුතු අපහසුවකින් තොරව ඉටු කර ගන්නා ලදී. බොල්ශෙවික් පක්ෂය තුල, සන්නද්ධ නැගිටීමේ විරුද්ධවාදීන්ට එරෙහිව ලෙනින් කල අරගලයේ අර්ථභාරය ගැන ට්‍රොට්ස්කි පසුව මෙසේ සඳහන් කලේය.

පක්ෂය දැවැන්ත ඉදිරි පිම්මක් ගත යුතුව පවතින තත්වයක් තුල, එය පස්සට ඇදීමට තැත් කරන දෙවර්ගයක නායකයන් සිටින බව පැහැදිලි විය. ඉන් සමහරෙක් මූලික වශයෙන් විප්ලවයේ මාවතේ දුෂ්කරතා හා බාධා පමනක් දැකීමට සාමාන්‍යයෙන් නැඹුරු වන්නේ ය; ඔවුන් සෑම තත්වයක් ම තක්සේරු කරන්නේ, සෑම විට ම දැනුවත් නො වූවත්, කලින් ම ඇති කර ගත් මොන යම් හෝ ක්‍රියාවක් මග ඇරීමේ අධ්‍යාසයකිනි. ඔවුන් අත මාක්ස්වාදය, විප්ලවකාරී ක්‍රියාවේ නොහැකියාව තහවුරු කිරීමේ විධික්‍රමයක් බවට පරිවර්තනය වෙයි. මෙම වර්ගයේ පිරිසිදු ම ආදර්ශය නම් රුසියානු මෙන්ෂෙවිකයෝය. එහෙත් මේ වර්ගය දක්නට ලැබෙන්නේ මෙන්ෂෙවිකයන් අතර පමනක් නො වේ, ඉතා ම තීරනාත්මක මොහොතේ දී, එබන්දෝ ඉතා ම විප්ලවවාදී පක්ෂයේ පවා වගකිව යුතු තනතුරු දරන්නන් අතර හිටි අඩියේ පහල වෙති. දෙවන වර්ගය සංලක්ෂනය වන්නේ ඔවුන්ගේ මතුපිටට සීමා වූ උද්ඝෝෂක ආකල්පයකිනි. ඔවුහු බාධා හෝ දුෂ්කරතා සමග තමන් මුහුනට මුහුන ලා ගැටෙන තෙක් ම ඒවා දැක ගැනීමට අසමත් වෙති. ඝෝෂා කාර වචනවලින් සැබෑ දුෂ්කරතා මැඩ පැවැත්වීමේ හැකියාව ද, සියලු ප්‍රශ්න පිලිබඳ පුහු සර්ව සුභවාදයක් ප්‍රදර්ශනය කිරීමේ ප්‍රවනතාව ද ("මහ සයුරේ ගැඹුර දනක් පමනි"), තීරනාත්මක ක්‍රියාව සඳහා මොහොත එලඹි කල්හි, එහි ධ්‍රැවීය ප්‍රතිවිරුද්ධය බවට නො වැලැක්විය හැකි ලෙස පරිවර්තනය වෙයි. කෙන්ද කන්ද කර ගන්නා පලමු වර්ගයේ විප්ලවවාදියාට, බලය අල්ලා ගැනීමේ දුෂ්කරතාව පවතින්නේ තම වැඩ කටයුතුවල දී හමු වූ සියලු බාධාවන් ගොඩ ගසා ගෙන නහුතයට ම වර්ධනය කර ගැනීම තුල ය. දෙවන වර්ගයට, එනම් මතුපිට සර්ව-සුභවාදියාට, විප්ලවවාදී ක්‍රියාවේ දුෂ්කරතා පැමිනෙන්නේ සෑම විට ම පුදුමයක් ලෙස ය. සූදානම් කාල පරිච්ඡේදයේ දී මේ දෙදෙනාගේ ම හැසිරීම එකිනෙකට වෙනස් යඃ පලමු වැන්නා, විප්ලවවාදී අර්ථයකින්, එතරම් විශ්වාසය තැබිය නො හැකි සංශයවාදියෙකි; දෙවැන්නා, මීට ප්‍රතිකූලව, උමතු විප්ලවවාදියෙකු සේ පෙනිය හැකි ය. එහෙත් තීරනාත්මක මොහොතේ දී, දෙදෙනා අතිනත ගෙන ගමන් කරති; දෙදෙනා ම සන්නද්ධ නැගිටීමට විරුද්ධ වෙති. [11]

30. රුසියානු විප්ලවය, ලෝකය පුරාම මහා පෙරලිවලට ආරම්භක උත්තේජනයක් සැපයීය. විප්ලවකාරී ආන්ඩුව යුද්ධය නැවැත්විය යුතු යයි ප්‍රකාශ කරමින්, යුද්ධයේ යෙදී සිටි පාර්ශවවල අධිරාජ්‍යවාදී සැලසුම් පෙන්නුම් කරන රහස් ගිවිසුම් එලිදරව් කලේ ය. තම තමන්ගේ ආන්ඩුවලට එරෙහිව නැගී සිටින මෙන් සෑම රටකම කම්කරුවන්ට කියා සිටියේය. බෝල්ශෙවික්-නීත විප්ලවය පැහැදිලිව ම මහජන සහයෝගය ලද්දේ ය යන කරුන නොතකූ මෙන්ෂෙවිකයෝ, තාවකාලික ආන්ඩුව පෙරලා දැමීමට දැක්වූ තම විරුද්ධත්වය දිගින් දිගට ම පවත්වාගෙන ගියෝ ය. ආන්ඩුව පෙරලා දැමූ පසුව ද, කමනෙව් වැනි මධ්‍යස්ථ බොල්ශෙවිකයන්, මෙන්ෂෙවික් වරු තාවකාලික ආන්ඩුවට බඳවා ගැනීමට දරන ලද ප්‍රයත්නය ව්‍යර්ථ විය. තමන් බොල්ශෙවික්වරුන් සමග සහයෝගී වීමේ කොන්දේසි හැටියට මෙන්ෂෙවික්වරුන් ඉදිරිපත් කලේ ලෙනින් හා ට්‍රොට්ස්කි සියලු බලධාරී තනතුරුවලින් ඉවත් කල යුතුය යන්න පමනක් නොව ඔවුන් පොලිස් බලධාරීන්ට බාරදිය යුතුය යන්න ද විය!

31. යම් හෙයකින් බොල්ශෙවික් පක්ෂය බලයට පත්වීමට අසමත් වී නම් එහි ප්‍රතිඵලය විය හැකිව තිබුනේ ලේ වැකි ප්‍රති විප්ලවයකි. යලි සාර් බලයට ගෙන ඒම හෝ මිලිටරි ඒකාධිපතිත්වයක් පිහිටුවීමකි. ධනේශ්වරය ද ඔවුන්ගේ අධිරාජ්‍යවාදී අනුග්‍රාහකයින් ද ආරම්භක කම්පනයෙන් සිහි එලවාගත් පසු, විප්ලවවාදී පාලනය පෙරලා දැමීම සඳහා සිවිල් යුද්ධයක් උසිගන්වා ලූහ. ට්‍රොට්ස්කිගේ නායකත්වය යටතේ, සෝවියට් පාලනය ප්‍රතිවිප්ලවයෙන් ආරක්ෂා කර ගැනීම උදෙසා රතු හමුදාව පිහිටුවන ලදී. ට්‍රොට්ස්කි යුද්ධ මූලෝපායඥයකු හා ධීමත් සංවිධායකයකු ලෙස ඉස්මත්තට පැමිනියේ ය. එහෙත් රතු හමුදාවේ නායකයා ලෙස ඔහුගේ සාර්ථකත්වය වූයේ, කම්කරු පන්තිය මුහුන දී සිටි වෛෂයික කර්තව්‍යයන් පිලිබඳව ඔහුට තිබුනු අනුපමේය වැටහීම ද, මෙම වැටහීම මහජනතාව තුලට කාවැද්දීමට ඔහුට තිබුනු දක්ෂතාව ද වේ. 1918 අප්‍රේල් මාසයේ දී ට්‍රොට්ස්කි කල කතාවකදී මෙය මෙසේ පැහැදිලි කලේ ය.

ඉතිහාසය වනාහී කම්කරු පන්තිය රැක බලාගන්නා ඉවසන සුලු, මෘදු මාතෘකාවක් නොවේ. ඇය වනාහී ලේවැකි අත්දැකීම් තුලින් ඔවුන් කෙසේ තම අරමුනු දිනාගත යුතු දැයි කම්කරුවන්ට උගන්වන්නට සැරසුනු දුෂ්ට කුඩම්මා කෙනෙකි. වැඩ කරන ජනයා සමාව දීමට හා අමතක කර දැමීමට පහසුවෙන් සූදානම් ය. ප්‍රධාන වැඩය කෙරී ඇතැයි ඔවුන්ට හැඟී යන්නට අවශ්‍යවන්නේ අරගලයේ කොන්දේසි මඳක් පහසු වීම ය, යම් දෙයක් දිනාගෙන තිබෙන බවක් පෙනී යාමය. ඔවුන්ට සමාජශීලී බවක් දැක්වීමට ඒ ඇති ය; එවිට ඔවුහු අකර්මන්‍ය වෙති. සටන ඇනහිටුවති. එහෙත් දේපල හිමි පන්තිය කවර කලෙකවත් තම අරගලය නවත්වන්නේ නැත. වැඩ කරන ජනතාවගේ පීඩනයට නිරන්තරව විරුද්ධවීමට අවශ්‍ය අධ්‍යාපනය ඔවුනට ලැබී තිබේ; ඉතින් අපගේ පැත්තේ ඕනෑම අකර්මන්‍යතාවක, අභිරහසක, හෝ වැනීමක ප්‍රතිඵලය වනු ඇත්තේ, අපගේ දුර්වල ස්ථානය දේපල හිමි

පන්තීන්ගේ ප්‍රහාරයන් සඳහා විවෘත කොට හෙට හෝ අනිද්දා ඔවුන් අපට එරෙහිව නව ප්‍රහාරයක් දියත් කිරීම ය. කම්කරු පන්තියට අවශ්‍ය වන්නේ ටෝල්ස්ටෝයි දේශනා කල සාර්වත්‍රික සමාව නොව, සිය ජීවිතය යහපත් කරගැනීමේ සටන් මග දිගේ තබන පියවරක් පාසා, අඟලක් අඟලක් පාසා, නිරන්තර, අශමනීය, කටුක අරගලයක් සහ එම අරගලය සංවිධානය කිරීමෙන් තොරව ගැලවීමක් හෝ නිදහසක් ඇති විය නොහැකිය යන දැඩි පන්නරය ද අප්‍රතිහතභාවය ද, ප්‍රගාඪ විශ්වාසය ද වේ.[12]

32. රුසියානු විප්ලවයේ ඉරනම රඳා පැවත්තේ, සෝවියට් රුසියාවේ දේශසීමාවෙන් ඔබ්බට විප්ලවය දිගේලි කිරීමෙන් යයි බොල්ශෙවික්වරු වටහා ගෙන සිටියාහ. මෙම ආස්ථානය ජාත්‍යන්තර සමාජවාදයේ විශිෂ්ඨතම නියෝජිතයන් විසින් දරනු ලැබිනි. බොල්ශෙවික්වරුන් ආරක්ෂා කරමින් රෝසා ලක්ෂම්බර්ග් මෙසේ ලියා තැබුවා යඃ "ලෙනින් හා ට්‍රොට්ස්කි ද ඔවුන්ගේ මිත්‍රයෝ ද ප්‍රථමයෝ වූහ. ලෝකයේ කම්කරු පන්තියට ආදර්ශයක් දෙමින් ඔවුහු පලමුවෙන්ම ඉදිරියට ගමන් කලෝ ය; හුට්ටන් හා එක්වඃ "මම ඉදිරියට ගියෙමි ය" යි හඬනැගීමට මේ වන තෙක් සුදුසුකම් ලබා සිටින්නේ ඔවුන් පමනකි. රුසියානු විප්ලවය සමාජවාදය පිලිබඳ ප්‍රශ්නය පැහැදිලි න්‍යායික ප්‍රශ්නයක සිට ප්‍රායෝගික ප්‍රශ්නයක් බවට පරිවර්තනය කර තිබේ. එහෙත් ලක්ෂම්බර්ග් පහත සඳහන් කරුන ද අවධාරනය කලා යඃ රුසියන් විප්ලවයේ ඉරනම රැඳී පවත්නේ රුසියාවේ දේශසීමාවෙන් ඔබ්බේ පන්ති අරගලයේ ප්‍රතිඵලය උඩය. ඇය මෙසේ ලීවා යඃ "රුසියාව තුල කල හැකි වූයේ ප්‍රශ්නය ඉස්මතු කිරීම පමනි. එය රුසියාව තුල විසඳිය හැක්කක් නොවේ. මෙම අර්ථයෙන් ගත් කල්හි සෑම රටක ම අනාගතය හිමි බොල්ශෙවික්වාදයට ය"[13] ධනපති පන්තිය එවකට පැන නගිමින් පැවති විප්ලවවාදී ව්‍යාපාරයන් තුල ද භයානක සතුරන් දුටුවෝ ය. ලෝක අධිරාජ්‍යවාදයේ සියලුම බලවතුන්ගේ ඒකාබද්ධ බලය යොදා, රුසියාව තුල ප්‍රතිවිප්ලවයේ ආධාරය සඳහා ආක්‍රමනයක් දියත් කලේ ය. ජර්මනියේ දී ප්‍රතිවිප්ලවයේ බලවේගයෝ 1918 නොවැම්බර් කම්කරු පන්ති නැගිටීම මඟින් බලයට ඔසවනු ලැබ සිටි සමාජප්‍රජාතන්ත්‍රවාදීන් සමග එක්වී, 1919 ජනවාරියේ දී රෝසා ලක්ෂම්බර්ග් සහ කාර්ල් ලිබ්නෙක්ට් ගේ ඝාතනය සංවිධානය කලෝ ය. 1917 සිද්ධීන්ගෙන් පාලක පන්තීන් උගෙන තිබුනේ, කම්කරු පන්තියේ ස්වාධීන නායකත්වයක් වර්ධනය වීම කෙසේ හෝ වැලැක්විය යුතුව ඇතැයි යන්නයි. 20 වන ශතවර්ෂයේ ලේවැකි සිද්ධීන්ගෙන් විදහා දැක්වෙන්නේ පාලක පන්තීහු ද, සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන් හා ස්ටැලින්වාදීන් අතර ඔවුන්ගේ ඒජන්තයින් ද, මෙම පාඩමෙන් කොතරම් දුරට මෙහෙයවනු ලැබුවාහුද යන්න ය.

## කොමියුනිස්ට් ජාත්‍යන්තරය

33. තුන්වන හෙවත් කොමියුනිස්ට් ජාත්‍යන්තරය (කොමින්ටර්න්) තම ප්‍රථම සම්මේලනය 1919 මාර්තු මස මොස්කව්හි දී පැවැත්වූයේ ය. ඒ වනවිට සෝවියට් සමූහාන්ඩුව පැවැතුනේ අධිරාජ්‍යවාදී ආධාර ලත් ප්‍රතිවිප්ලවවාදී බලවේගයන්ට එරෙහි ආරක්ෂක යුද්ධයක යෙදීගෙන ය. වට ලනු ලැබූ මෙම තත්වය තුලදී ම, කොමියුනිස්ට් ජාත්‍යන්තරය ජාත්‍යන්තර කම්කරු පන්තිය මුහුනදී සිටි ප්‍රායෝගික කර්තව්‍යයන් ලෙස, ලෝක විප්ලවය සඳහා ක්‍රියාමාර්ගය මූලෝපාය හා උපාය විස්තාරනය කලේ ය. 1914 ඛේදජනක අත්දැකීම් උකහා ගත් කොමියුනිස්ට් ජාත්‍යන්තරය, දෙවැනි ජාත්‍යන්තරය විනාශ වීමට හේතුභූත වූ අවස්ථාවාදය හා සංශෝධනවාදය ට එරෙහි සම්මුති විරහිත අරගලයක් මත පදනම් කරන ලදී. 1920 ජූලි 30 දා ට්‍රොට්ස්කි <u>කොමියුනිස්ට් ජාත්‍යන්තරයට ඇතුලත් කර ගැනීමේ කොන්දේසි පිලිබඳ ප්‍රවාදයන්</u> ඉදිරිපත් කලේය. එය ජාත්‍යන්තර විප්ලවවාදී සංවිධානය තුල සාමාජිකත්වය පිලිබඳ --කරුනු 21" යයි ප්‍රසිද්ධ විය. කොමින්ටර්නයේ සාමාජිකත්වය දරන පක්ෂ විසින් "නිතිපතා සහ ක්‍රමානුකූලව ප්‍රතිසංස්කරනවාදීන් සහ මාධ්‍යමිකයන් සියලුම දෙනා කම්කරු ව්‍යාපාරයේ සෑම වගකිවයුතු තනතුරුවලින් ඉවත් කර දැමිය යුතුය"යි ද "ප්‍රතිසංස්කරනවාදය සහ මාධ්‍යමික දේශපාලනයෙන් මුලුමනින්ම බිඳීමේ අවශ්‍යතාවය" පිලිගත යුතු යයි ද ...[14] එය නිගමනය කලේය.

34. කොමින්ටර්නය පිහිටුවන ලද්දේ, ලෝකය පුරාම කොමියුනිස්ට් පක්ෂයන් වර්ධනය කිරීම අධීක්ෂනය කරන්නා වූ "විප්ලවවාදී මූලෝපායේ පාසලක්" ලෙස බව ට්‍රොට්ස්කි පැහැදිලි කලේ ය. වෛෂයික තත්වය පිලිබඳ වටහා ගැනීමක්, නිවැරදි මූලෝපාය විස්තාරනය කිරීමක් සහ අවස්ථාවාදයට එරෙහි අරගලය, මෙම පුහුනුවට ඇතුලත් විය. ට්‍රොට්ස්කි මෙසේ ලියා තැබීයඃ "යුරෝපයේ ද ලොව පුරා ම ද විප්ලවවාදී කම්කරු පන්තියේ කර්තව්‍යය සමන්විත වන්නේ, ධනේශ්වරය හොඳින් සිතා මතා සකස්කරගෙන ඇති ප්‍රතිවිප්ලවවාදී මූලෝපායට එරෙහිව, අන්තයටම සිතා බලා නිර්නය කරන ලද කම්කරු පන්තියේම විප්ලවවාදී මූලෝපාය ඉදිරිපත් කිරීම ය. මේ සඳහා ප්‍රථමයෙන් ම අවශ්‍යවන්නේ, ධනේශ්වරය ස්වයංක්‍රීය ආකාරයට, යාන්ත්‍රිකව, හුදෙක් එය ඉතිහාසයෙන් තොලොංචි කරන තීන්දුවක් ඇති නිසාම පමනක් පෙරලා දැමීම කල නොහැක්කක් බවය."[15]

35. පලමුවන ලෝක යුද්ධය අවසානයේදී, විප්ලවය ප්‍රසාරනය කිරීම ආසන්න හැකියාවක් ලෙස පැවතුනි. 1918 ජර්මනියේ විප්ලවය පැනනැගීම නිසා ජර්මන් අධිරාජ්‍යයා වූ කයිසර්ට වහාම ඉල්ලා අස්වීමට සිදුවුනි. සමූහාන්ඩුවක් ප්‍රකාශයට පත් කරන ලදී. දේශපාලන බලය ජර්මානු සමාජ ප්‍රජාතන්ත්‍ර පක්ෂය අතට පත්වූ අතර ඔවුහු විප්ලවයේ ගෙල මිරිකීම සඳහා තමන්ට

හැකි සෑම දෙයක්ම කලෝ ය. ඊට මාස 18 කට පෙර රුසියාවේ පැවතුනාට වඩා වෙනසක් 1918-19 ජර්මනියේ පැවතුනි. එනම් සංශෝධනවාදයට හා මාධ්‍යමිකවාදයට එරෙහිව අප්‍රතිහත අරගලයකින් පන්නරය ලද බොල්ශෙවික් වර්ගයේ දේශපාලන පක්ෂයක් ජර්මනිය තුල නොපැවතීම යි. සමාජ ප්‍රජාතන්ත්‍ර පක්ෂයෙන් බිඳී වෙන්වීම සඳහා එහි (එස්පීඩී) වාමාංශික විරුද්ධවාදියෝ, උවමනාවට වඩා කාලයක් ගත කර තිබුනාහ. එම විරුද්ධ පක්ෂයේ සැලකියයුතු කොටසක් එස්පීඩීය සහ බොල්ශෙවික්වාදය අතරමැද ස්ථානයක සිට ගත්හ. ජර්මනියේ වඩාත්ම විප්ලවවාදී පාර්ශවය වූ ස්පාටසිස්ට් කන්ඩායම කොමියුනිස්ට් පක්ෂයක් පිහිටුවීම සඳහා 1918 දෙසැම්බර් වන තුරුම කල් ගත කලේ ය. ඉක්බිති, 1919 ජනවාරියේ දී, අවශ්‍ය සූදානමින් ද මූලෝපායික සැලසුමින් ද තොරව බර්ලිනයේ සන්නද්ධ නැගිටීමක් සිදු කැරිනි. එස්පීඩී පාලන තන්ත්‍රය නැගිටීම පාගාදැමීම සඳහා දක්ෂිනාංශික සන්නද්ධ හදිසි ප්‍රහාරක බලකායන් බලමුලු ගැන්වූහ; රෝසා ලක්ෂම්බර්ග් හා කාල් ලිබ්නෙක්ට් ඝාතනය අනුමැතිය දී සූදානම් කලහ.

36. සන්නද්ධව නැගී සිටි කම්කරු පන්තිය යුරෝපයේ ස්ථාන ගනනාවකදී ම පරාජයන්ට ලක් වූහ. යලිත් 1921 මාර්තු මාසයේ දී, ජර්මන් රාජ්‍යය සාපේක්ෂ අපහසුවකින් තොරව තවත් සන්නද්ධ නැගිටීමක් මර්දනය කලේය. 1921 කොමින්ටර්නයේ තුන්වන සම්මේලනයේ දී ලෙනින් සහ ට්‍රොට්ස්කි " අතිවාමවාදයට" එරෙහිව තීරනාත්මකව මැදිහත්වූහ. පලමුවෙන් මහජනතාව දිනාගන්නේ නැතිව කොමියුනිස්ට් පක්ෂයන්ට බලය අල්ලා ගත නොහැකි බව ඔවුහු අවධාරනය කලහ. ලෙනින් විසින් ලියන ලද *"වාමාංශික" කොමියුනිස්ට් වාදය - ළදරු වලිප්පුවක්* නම් පොත් පිංච කොන්ග්‍රස් සාමාජිකයන් අතර බෙදාහරින ලදී. බොල්ශෙවික් පක්ෂය වැඩී ආවේ හුදෙක් මෙන්ෂෙවික්වාදයට එරෙහිව පමනක් නොව "අරාජකවාදය බඳු ගති ලක්ෂන පල කරන, නැතහොත් සෑම වැදගත් ප්‍රශ්නයකින් ම යමක් පිරුලට ගැනීමට ද, කම්කරු පන්ති අරගලයේ අවශ්‍යතාවයන්ට හා තත්වයන්ට නොසරිලන සුලුධනේශ්වර විප්ලවවාදයට" එරෙහිව ද යයි ලෙනින් පෙන්වා දුනි." [16]

37. විප්ලවවාදී පක්ෂය විවිධ දේශපාලන අරගල රූපයන්හි කල්තබා නිරතවී නිපුනව සිටියේ නැති නම් 1917 ඔක්තෝබර් ජයග්‍රහනය අත් කර ගැනීමට අසමත් වනු ඇතැයි ලෙනින් පැහැදිලි කලේ ය. සියලු තත්වයන් යටතේ දේශපාලන සම්මුතීන් ප්‍රතික්ෂේප කලා වූ ද, මැතිවරන පාර්ලිමේන්තු කටයුතුවල යෙදීමේ නීතියුක්ත බව ප්‍රතික්ෂේප කලා වූ ද, ප්‍රතිගාමී වෘත්තීය සමිති තුල වැඩකිරීම නොකට යුත්තකැයි කියා සිටියා වූ ද, රැඩිකල් මිථ්‍යාවන් ඔහු ප්‍රතික්ෂේප කලේය. කම්කරු පන්තියේ පක්ෂපාතීත්වය දිනාගැනීම උදෙසා වඩාත් දීර්ඝ කාලයක් තිස්සේ කටයුතු කිරීමට කොමියුනිස්ට් පක්ෂ සූදානම් වියයුතු යයි තුන්වන සම්මේලනය උපදෙස් දුන්නේ ය. ලෙනින් හා ට්‍රොට්ස්කි දිරි දුන් එක් උපායික ආරම්භයක් වූයේ, පෘථුල කම්කරු පන්ති සංවිධානවල "එක්සත් පෙරමුනක්" පිලිබඳ ඉල්ලීම යොදාගැනීම ය. "එක්සත් පෙරමුනේ" අරමුන වූයේ කම්කරු පන්තියේ ආරක්ෂාව සංවිධානය කිරීමයි. නැතහොත් කොමියුනිස්ට් පක්ෂවල විප්ලවවාදී ආරම්භක ශක්තිය ද, සමාජප්‍රජාතන්ත්‍රවාදීන්ගේ රැවටිලිකාරී භාවය ද, යන දෙකම මහජනතාවට පැහැදිලිවන පරිද්දෙන්, වැදගත් ප්‍රශ්න උඩ අරගල සංවිධාන කිරීම ය. එක්සත් පෙරමුනේ ඉලක්කය දේශපාලන වශයෙන් 'පොදු සමාවක්' ප්‍රකාශ කර ගැනීම හෝ දේශපාලන විරුද්ධවාදීන් විවේචනය කිරීමෙන් වැලකීම හෝ නොවේ. ඒ වෙනුවට, එහි ඉලක්කය වූයේ අරගලයේදී එක්සත් වීමට කම්කරු පන්තියට පවත්නා වෛෂයික අවශ්‍යතාවය සාක්ෂාත් කරන අතර ම, එම අවශ්‍යතාවේ අවස්ථාවාදී සතුරන් එලිදරව් කරමින් කම්කරු පන්තියේ දේශපාලන විඥ්ඥානය ඔසොවාලීම ය.

38. තුන්වන සම්මේලනය විසින් ඇතිකල දේශපාලන සීරු මැරු කිරීම් සැලකියයුතු ජයග්‍රහන අත්කර ගත්තේය. විශේෂයෙන්ම ජර්මනිය තුල කොමියුනිස්ට් පක්ෂයේ අධිකාරය සැලකියයුතු අර්ථයකින් වර්ධනය විය. එහෙත් 1923 ආරම්භයේ දී එරට දේශපාලන තත්වය තියුනු ලෙස වෙනස් විය. වසන්තය මුලදී ජර්මන් ආර්ථිකය ව්‍යසනකාරී ලෙස බිඳවැටීම ද, ඒ සමගම උද්ධමනය පෙරනුවූ විරූ පරිදි ඉහල නගිමින්, ධනේශ්වර රාජ්‍යය පෙරලා දැමීම කරා මග විවෘත කරන බවක් පෙනී ගියේය. අපකීර්තියට පත්වූ එස්පීඩී සංවිධානයේ සාමාජිකත්වය වේගයෙන් දියවී ගිය අතර, කොමියුනිස්ට් පක්ෂයේ (කේපීඩී) සාමාජිකත්වය වැඩී ගියේ ය. 1923 ඔක්තෝබරය වන විට සාර්ථක විප්ලවයක් සඳහා වෛෂයික තත්වයන් අත්‍යසාමාන්‍ය ලෙස වාසි සහගත වූ බවක් පෙනී ගියේ ය. ඔක්තෝබර් 25 දා ආයුධ සන්නද්ධ නැගිටීමක් උදෙසා දින නියම කරන ලදී. එය සෝවියට් විප්ලවයේ සයවන සංවත්සරය ද විය. එහෙත්, අන්තිම මොහොතේ, හෙන්ඩ්‍රික් බ්‍රැන්ඩ්ලර්, එවකට කේපීඩී නායකයා නියමිත නැගිටීම කැන්සල් කලේ ය. නගරවල ප්‍රාදේශීය නායකයන් මෙම තීන්දුව නොදැන හුදෙකලා නැගිටීම් ප්‍රදේශීව සංවිධානය කල අතර රාජ්‍ය හමුදා විසින් වහ වහා මර්දනය කරන ලදී. ජර්මානු ඔක්තෝබරය සමාජවාදී විප්ලවයේ අර්ථයෙන් පුස්සක් බවට පත්විය.

39. ට්‍රොට්ස්කිට අනුව, විප්ලවය සඳහා අවශය වෛෂයික කොන්දේසි මෝරා ඇති තත්වයක් හමුවේ, නායකත්වය පිලිබඳ ආත්මීය සාධකය, බලය සඳහා අරගලයේදී තීරනාත්මක වැදගත් කමක් දරන්නේය යන ඉහලම දේශපාලන සත්‍යය, 1923 ජර්මානු විප්ලවයේ අසාර්ථකත්වය මඟින් නිශේධනය වී ඇති බවක් පෙන්නුම් කරයි. තවද, ඓතිහාසික අත්දැකීමක විදහා

දක්වන්නේ, බලය සඳහා අරගලයට අවතීර්න වීමත් සමඟ, විප්ලවවාදී පක්ෂය තුල බරපතලම දේශපාලන අර්බුදයක් පැනනැගීම අනිවාර්ය බවය. එවන් අර්බුදයෝ ඉමහත් අර්ථභාරයක් දරති: ඒවා විසඳන්නේ කෙසේද යන්න වසර ගනනාවක් නැත්නම් දශක ගනනාවක් යන තෙක් විප්ලවයේ ඉරනම තීන්දු කරනු ඇත. ට්‍රොට්ස්කි මෙසේ ලිවීය:

විප්ලවවාදී පක්ෂයක් වෙනත් දේශපාලන බලවේගයන්ගේ පීඩනයට ලක් වෙයි. පක්ෂයේ වර්ධනයෙහි දෙන ලද තත්වයක් තුල, මෙම පීඩනයට එරෙහිව සටන්වැදීමේදී තමන්ට ම ආවේනික විධික්‍රමයන් පක්ෂය විසින් විස්තාරනය කර ගනු ලැබේ. උපායික නැම්මක් ගැනීමේදී, එහි ප්‍රතිඵල ලෙස අභ්‍යන්තර නව පෙලගැසුම් හා ගැටුම් ඇතිවන තතු තුල, පක්ෂයේ ප්‍රතිරෝධක ශක්තිය දුබලවේ. මෙයින් සැමවිටම, උපායික නැම්මක් ගැනීමේ දී උපදින අභ්‍යන්තර කාන්ඩගැසීම්, ඒවායේ ආරම්භක ලක්ෂයන් වන විවාදිත කරුනුවලින් බොහෝ ඔබ්බට වැඩී, විවිධ පන්ති ප්‍රවනතාවයන්ට ආධාරකයක් වීමේ හැකියාව නිරතුරුව පවතී. ප්‍රශ්නය වඩාත් සරලව ඉදිරිපත් කරතොත්: තමන්ගේම පන්තියේ ඓතිහාසික කර්තව්‍යය සමග අඩි තබා පෙරට යාමට පක්ෂය අසමත් වෙයි. එමගින් වෙනත් පන්තිවල අනියම් උපකරනය බවට පරිවර්තනය වීමේ අනතුරට පක්ෂය මූනපායි." [17]

## ස්ටැලින්වාදයේ උල්පත් සහ වාම විපාර්ශවය පිහිටුවීම

40. ජර්මන් විප්ලවයේ පරාජය, සෝවියට් රාජ්‍යය හා පක්ෂ නිලධරය තුල වර්ධනය වෙමින් පැවති තත්වාරක්ෂක ප්‍රවනතාවයන් තවදුරටත් ශක්තිමත් කිරීමට සැලකියයුතු අන්දමින් තුඩු දුන්නේ ය. විශේෂයෙන් ම 1921 වසන්තයේ දී සෝවියට් පාලනය විසින් නව ආර්ථික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු ලැබීමෙන් පසුව මෙම ප්‍රවනතාවෝ තව තවත් ශක්තිමත් වූවෝ ය. නව ආර්ථික ප්‍රතිපත්තිය ධනේශ්වර වෙලඳපල යලි පන ගැන්වීමක් ද නගරයේ හා පිටිසර ධනේශ්වර ස්ථරයන්ට සැලකියයුතු ආර්ථික සහනයන් ද සැලසී ය. මෙම සහනයන්හි අරමුන වූයේ යුද්ධය හා විප්ලවයේ සමය තුල කුඩුකර දමනු ලැබූ ආර්ථික ක්‍රියාකාරකම් යලි පන ගැන්වීමය. සාපේක්ෂකව ජාත්‍යන්තර විප්ලවකාරී අරගලයේ නව නැගීමක් එන තෙක් සෝවියට් සංගමයට කාලය දිනාගැනීම සඳහා සැකසුනු නව ආර්ථික පිලිවෙත සාපේක්ෂකව කෙටි කාලයකින් හමාර කිරීමට ලෙනින් හා ට්‍රොට්ස්කි අපේක්ෂා කල නමුත්, එය තුලින් තත්වාරක්ෂක සමාජ බලවේග ශක්තිමත් කිරීමක් සිදු වී සෝවියට් ජීවිතය තුල ආර්ථික හා දේශපාලන ගතිකය වෙනස් කිරීමට තුඩු දුනි. මෙම සන්තතීන් බොල්ශෙවික් පක්ෂය තුලට ම බලපෑ අතර පක්ෂ නායකත්වය තුල ට්‍රොට්ස්කිගේ තත්වයට ද අහිතකර බලපෑමක් ඇති කලේ ය. පාලක ස්ථරය තුල ද වේගයෙන් ප්‍රසාරනය වූ පක්ෂ සාමාජිකත්වය සහ පක්ෂ හා රාජ්‍ය නිලධාරී තන්ත්‍රය තුල ද තත්වාරක්ෂක හා උදාසීන මනෝගති තහවුරු වී එන්න එන්න ම වඩාත් විවෘත දේශපාලන ප්‍රකාශනයක් අත්කර ගති. ට්‍රොට්ස්කි තමන්ගේ ස්වයං චරිතාපදානය තුල (My Life) මෙය සිහි කලේ ය.

--දැන්, සියල්ල සැම අවස්ථාවකදී ම විප්ලවය සඳහා (කැප කල යුතු) නොවේ, තමන්ටත් යමක් සලසා ගත යුතු ය" යන හැඟීම දැන් පහත සඳහන් ආකාර උච්චාරනයක් අත්පත් කර ගත්තේ ය: --නොනවතින විප්ලවය හංගවේවා!" විප්ලවයේ මහන්සිකර හා බැරෑරුම් ඉල්ලීම්වලට එරෙහි කැරැල්ල මහජනයාගේ ඇස් ඉදිරිපිට දැන් ගත් ස්වරූපය වූයේ --ට්‍රොට්ස්කිවාදයට එරෙහි අරගලය" යන්න ය. බොල්ශෙවික් පක්ෂය තුල සැඟව සිටි පිලිස්තීනුවාගේ විමුක්තිය සාධා දීමට ගමන් කලේ මෙය මා අතින් බලය ගිලිහී යාමට හේතු විය. බලය අහිමි වී යාමේ ස්වරූපය නීර්නය කරන ලද්දේ මෙය විසිනි." [18]

41. ට්‍රොට්ස්කි ගොවි ජනයා අවතක්සේරුවට ලක් කරන්නේ ය" යන බොරුවෙන් අරඹා නොනවතින විප්ලව න්‍යායට ද ලියොන් ට්‍රොට්ස්කිට ම ද එල්ල කල ප්‍රහාර වනාහී ඔක්තෝබර් විප්ලවයේ ජාත්‍යන්තරවාදී ක්‍රියාමාර්ගය කෙරේ, ඒ වන විට වැඩෙමින් තිබුනු රාජ්‍ය හා පක්ෂ නිලධරය දැක්වූ විරුද්ධත්වයේ දේශපාලන පිලිබිඹුවක් විය. ස්ටැලින්ගේ ද ඔහුගේ නම බැඳී පැවැති නිලධාරිවාදී ඒකාධිපතිත්වයේ ද වැඩෙන දේශපාලන බලය ද සමාජවාදී විප්ලවයේ අනිවාර්ය ප්‍රතිඵලයක් වූයේ නැත. එය පසුගාමී රටක් තුල ජාත්‍යන්තර විප්ලවයේ පරාජයන් විසින් හුදෙකලා කැරුනු, පසුගාමී රටක පිහිටැවුනු කම්කරු රාජ්‍යයකට සුවිශේෂ වූ ප්‍රතිසතිතාවන් තුලින් වර්ධනය වූ තත්වයකි. සාර්වාදී රුසියාවෙන් උරුම වූ ආර්ථික පසුගාමිත්වයේ උරුමය අධිරාජ්‍යවාදී යුද්ධයේ (1914-1917) සහ සිවිල් යුද්ධයේ (1918-21) සත් වසරක් විසින් උග්‍ර කරනු ලැබ තිබිනි. මෙම තත්වයන්, සෝවියට් ආර්ථිකය ගොඩනැඟීමට බොල්ශෙවික් තන්ත්‍රය විසින් ගත් උත්සාහය තුල ඉමහත් දුෂ්කරතාවන් මතු කලේය. එතකුදු නොව, සිවිල් යුද්ධය කම්කරු පන්තිය ද බොල්ශෙවික් පක්ෂය ද යන දෙකෙන් ම ජීවිත වශාල සංඛ්‍යාවක් උදුරාගෙන තිබුනි. බොල්ශෙවික් වරුන්ට බලය අල්ලා ගැනීම සඳහා පදනම සැපයූ පන්ති විඥ්ඥානයෙන් යුතු කම්කරුවන්ගෙන් ලක්ෂ සංඛ්‍යාවක් මරනයට පත් වුනේ ය. බොල්ශෙවික් පක්ෂයේ පිරිහීමේ ලා තවත් ප්‍රමුඛ සාධකයක් වූයේ එහි සාමාජිකයන්ගෙන් සැලකියයුතු සංඛ්‍යාවක් වැඩෙමින් පැවැති ධනේශ්වර රාජ්‍යය හා පක්ෂ නිලධරය තුලට උකහාගෙන තිබීමයි. දිගුකාලීන විප්ලවවාදීහු පරිපාලකයන් බවට පරිවර්තනය වූහ. මෙම වෙනස කල් යන විට ඔවුන්ගේ දේශපාලන යොමුව කෙරෙහි බලපෑය. තවද, නව රාජ්‍ය සඳහා

දක්ෂ පරිපාලකයන්ට පැවති ඉල්ලුම කරන කොට ගෙන, 1917 ට පෙර පැරනි පාලනයේ නිලධාරි තන්ත්‍රය තුල සේවය කල බොහෝ අය ඊට බඳවා ගැනීමට සිදුවිය. රාජ්‍ය ව්‍යුහය තුල ගොඩ ගැසුනු වෙනස්කම් අවසානයේදී, බොහෝ පැරනි බොල්ශෙවිකයන්ගේ සමාජ කටයුතුවල ද, කම්කරු පන්තියේ සමස්ත තත්වයෙහි ද, දේශපාලනිකව ප්‍රකාශිත විය.

42. ට්‍රොට්ස්කි පැහැදිලි කල පරිදි, විප්ලවයෙන් හා සිවිල් යුද්ධයෙන් පැන නැගි සෝවියට් රාජ්‍යය අතිශයින් ම පරස්පර විරෝධී ප්‍රපංචයක් විය. කම්කරු පන්තියේ අව්‍යාජ විප්ලවයක නිමැවුමක් ලෙස නව රාජ්‍යය, මූල්‍ය සම්පාදනය සහ නිෂ්පාදන මාධ්‍යයේ අයිතිය පාලනය කිරීම මත පදනම් වූ නව දේපල සබඳතා මත රැඳී සිටි අතර ඒවා ආරක්ෂා කලේ ය. මේ තාක් දුරට, 1917 ඔක්තෝබර් විප්ලවය විසින් නිර්මානය කරනු ලැබූ කම්කරු රාජ්‍යයක් විය. එහෙත් තවත් පැත්තක් තිබුනේ ය. සෝවියට් සංගමය තුල වූ නිෂ්පාදන බලවේගයන්ගේ අඩු මට්ටම ද "පොදු බවට පත් කරන ලද අගහිඟකම ද" යන තත්වයන් තුල නව රාජ්‍යය ධනේශ්වර - එනම් අසමාන - බෙදාහැරීමේ විධියක් අරක් ගෙන සිටියේ ය. මෙම මූලික ප්‍රතිසතිතාව - දේපල අයිතියේ සමාජවාදී රූපාකාරය සහ නිෂ්පාදනය බෙදාහැරීමේ ධනේශ්වර රූපය සෝවියට් පාලන තන්ත්‍රයට සුවිශේෂ වූ ද එන්න එන්නම වැඩිවන්නා වූ ද මර්දනකාරී ස්වභාවයක් පවරා දුනි.

43. රුසියානු විප්ලයේ බොහෝ වැදගත් නායකයින් ද සමඟ ට්‍රොට්ස්කි හා ඔහුගේ ආධාර කරුවෝ, සෝවියට් සංගමය තුල කොමියුනිස්ට් පක්ෂයේ පිලිවෙත ප්‍රති සංස්කරනය හා කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ පිලිවෙත නිවැරදි කර ගැනීම සඳහා සටන් කිරීමට 1923 දී වාම විපාර්ශවය ගොඩනැගුහ. වාම විපාර්ශවයේ සාමාජිකයෝ පක්ෂ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය දිරාපත්වීම විවේචනයට ලක් කල අතර සමාජවාදී සැලසුම් ශක්තිමත් කිරීමට හා කාර්මික භාන්ඩවල මිල පහත හෙළීමට තුඩු දෙන පරිදි රාජ්‍ය කර්මාන්ත ශක්තිමත් කිරීමට වැඩි අවධාරනයක් දුන් ආර්ථික පිලිවෙතක් උද්භාෂනය කලහ. ස්ටැලින් කල්ලිය කියා සිටියේ වෙළඳපල විවෘත කොට ගොවි ජනයා අතර පොහොසත් කොටස් දෙසට හැරීගත යුතුය කියා ය. 1924 ජනවාරියේ දී ලෙනින් මරනයට පත්වීමෙන් ස්ටැලින් නායකත්වය දුන් කන්ඩායමේ අත ශක්තිමත් විය. ඔහුගේ අවසාන ලියවිලිවල දී ලෙනින් කොමියුනිස්ට් පක්ෂය එන්න එන්න ම වැඩි වැඩියෙන් නිලධාරිකරනය වීම ගැන අනතුරු හැඟවූ අතර ප්‍රධාන ලේකම් තනතුරෙන් ඔහුව ඉවත් කල යුතු යයි කියා සිටියේ ය.

## මතු සම්බන්ධයි.

## සටහන්

[1] "යුරෝපානු යුද්ධයේ දී සමාජ-ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ කර්තව්‍යයෝ" (*V.I. Lenin Collected Works*) ලෙනින්, සංගෘහිත කෘති, 21 වෙලුම, (මොස්කව්: ප්‍රෝග්‍රෙස් පබ්ලිෂර්ස්, 1974), පිට 16.

[2] එම, 16 පි.

[3] එම, 17 පි.

[4] "දෙවන ජාත්‍යන්තරයේ බිඳ වැටීම", එම, 250 පි.

[5] ලියොන් ට්‍රොට්ස්කි, යුද්ධය හා ජාත්‍යන්තරය *War and the International*" (යංග් සෝෂලිස්ට් පබ්ලිකේෂන්ස්, 1971), පි.vii-viii

[6] එම, පි. xii-xiii

[7] "අධිරාජ්‍යවාදය සහ සමාජවාදය තුල භේදය" ලෙනින් සංගෘහිත කෘති: 23 වෙලුම, 105 පි.

[8] "අධිරාජ්‍යවාදය, ධනවාදයේ ඉහලම අවධිය", එම, වෙලුම 22, පි. 270.

[9] "රජය සහ විප්ලවය", එම, වෙලුම 25, පි.415.

[10] බලන්න. මහාචාර්ය ඇලෙක්සැන්ඩර් රබිනෝවිච්ගේ, බොල්ශෙවිකයන් බලයේ සිටියදී *The Bolsheviks in Power* (බ්ලූම්ගීල්ඩ්: ඉන්දියානා යුනිවර්සිටි ප්‍රෙස්, 2007).

[11] *ඔක්තෝබරයේ පාඩම් ලියොන් ට්‍රොට්*
ස්කි "කම්කරු පන්ති විප්ලවයක් තුල සෝවියට් සභා සහ පක්ෂය ගැන, යලිත්", කම්කරු මාවත ප්‍රකාශන 1996,) පිටු 8889.

[12] විප්ලවය සන්නාහ කලේ කෙසේද: *How the Revolution Armed*: මිලිටරි ලියවිලි සහ කතා ලියොන් ට්‍රොට්ස්කි, වෙලුම 1, 1918, පරිවර්තක බ්‍රයන් පෙයර්ස්, ලන්ඩන් නිව් පාර්ක් පබ්ලිකේෂන්ස්, 1979), පි. 58.

[13] රුසියානු විප්ලවය *The Russian Revolution*, (ඈන් ආබර්, මිචිගන් සරසවි මුද්‍රනාලය, 1961), පි. 80.

[14] තුන්වන ජාත්‍යන්තරයේ ප්‍රථම සම්මේලන හතරෙහි තීසීස, යෝජනා සහ ප්‍රකාශන *Theses, Resolutions and Manifestos of the First Four Congresses of the Third International* (ලන්ඩන්, ඉන්ක්ස් ලින්ක්ස්, 1980), පි. 93-94.

[15] කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ පලමුවන පස් වසර, *The First Five Years of the Communist International* වෙලුම දෙක (ලන්ඩන්, නිව් පාර්ක්, 1974), පි. 7.

[16] වාමාංශික කොමියුනිස්ට්වාදය ළදරු වලිප්පුවකි. ලෙනින්: තෝරාගත් කෘති, වෙලුම් දොලහ, වෙලුම 10, (මොස්කව්: ප්‍රගති ප්‍රකාශන, 1979) පි. 142-43.

[17] "ඔක්තෝබරයේ පාඩම්", වාම විපාර්ශවයේ අභියෝගය *Challenge of the Left Opposition* , පි. 228-29.

[18] මගේ ජීවිතය *My Life* (නිව් යෝර්ක්: චාර්ල්ස් ස්ක්‍රයිබ්නර්ස්සන්ස්, 1931), පි. 505.

© www.wsws.org